JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

ආදර්ශ ප්‍රශ්න පත්‍රයකි

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය
## අදියර III විභාගය - 2021 මාර්තු

## (304) සංස්ථාපිත හා පුද්ගලික බදුකරණය
(Corporate & Personal Taxation)

පිටු ගණන : 06
ප්‍රශ්න ගණන : 09

- අයදුම්කරුවන්ට උපදෙස් (අවධානයෙන් කියවිය යුතුය)
  (1) **දී ඇති කාලය :** කියවීම සඳහා - විනාඩි 15 යි.
  උත්තර ලිවීම සඳහා - පැය 03 යි.
  (2) **සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.**
  (3) ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්**, ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.
  (4) ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.
  (5) වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණන යන්ත්‍ර **පමණක්** භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.
  (6) ලකුණු 100

---

## A කොටස
(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

පහත කරුණු සඳහා ඔබෙන් පිළිතුරු අපේක්ෂා කෙරේ.

a) 2017 අංක 24 දරණ පනතේ දක්වා ඇති ආදායම් ප්‍රභව මොනවාද? (ලකුණු 02)

b) බදු අධිකාරීන් ලියා දක්වන්න. (ලකුණු 02)

c) එකම වර්ගයක බදු අය කරන අධිකාර දෙකක් ලියා දක්වා එවැනි බද්දකට උදාහරණයක් දක්වන්න. (ලකුණු 01)

(මුළු ලකුණු 05)

### 02 වන ප්‍රශ්නය

පහත සංකල්ප පැහැදිලි කර දෙන ලෙස බදු උපදේශකයකු වශයෙන් ඔබෙන් ඉල්ලා සිටී.

a) බද්දට යටත් වන්නේ කවුරුන්ද? (ලකුණු 03)

b) වාසික බව තීරණය කරන්නේ කෙසේද? (ලකුණු 02)

(මුළු ලකුණු 05)

### 03 වන ප්‍රශ්නය

බදු පරිපාලනය පිළිබඳ ආයතනයට ඇති වී තිබෙන පහත ගැටළු සඳහා ආයතනයේ ගණකාධිකාරී ලෙස ඔබෙන් උපදෙස් බලාපොරොත්තු වෙයි.

a) ස්ව තක්සේරු ක්‍රමය යනු කුමක්ද? සහ එම බදු මුදල් ගෙවිය යුතු දිනයන් මොනවාද? (ලකුණු 02)

c) ආදායම් බදු වාර්තාවක් සැපයිය යුතු දිනය කුමක්ද සහ සැපයීමට අපොහොසත් වුවහොත් ඇතිවන ප්‍රතිවිපාක මොනවාද? (ලකුණු 02)

d) තක්සේරුවකට එරෙහිව වලංගු අභියාචනයක් සිදු කල යුතු කාලසීමාව කුමක්ද? (ලකුණු 01)

(මුළු ලකුණු 05)

JMC Taxation Model Paper-Mahinda Danawardana

**04 වන ප්‍රශ්නය**

ආදායම් බදු ගෙවන ක්‍රමයක් ලෙස රඳවාගත් බදු ක්‍රමයක් ඉතා වැදගත් වෙයි. ඒ අනුව,

a) රඳවා ගැනීමේ බදු අය කරන නියෝජිතයන්ගේ කාර්‍යභාරය සහ එවැනි නියෝජිතයින් තුන්දෙනෙකු නම් කරන්න. (ලකුණු 02)

b) උපයන විට බදු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කල යුතු දිනය කුමක්ද? (ලකුණු 01)

c) රඳවාගැනීමේ බදු අඩු නොකලහොත් රඳවාගැනීමේ නියෝජිතයෙකුට ඇතිවන ප්‍රතිවිපාක මොනවාද? (ලකුණු 02)

(මුළු ලකුණු 05)

A කොටසෙහි අවසානය

## B කොටස

(මුළු ලකුණු 30)

**05 වන ප්‍රශ්නය**

තෙරේසා සහ මෙරේසා දෙදෙනා එකතුව උපදේශන සේවා සපයන ආයතනයක් ලෙස **තේරිමේරි සේවා** නමින් හවුල් ව්‍යාපාරයක් 2018 දී ආරම්භ කරන ලදී. ලාභාලාභ සම සමව බෙදා ගනී. හවුල් ව්‍යාපාරයේ සේවය කිරීම සඳහා මෙරේසා මාසිකව රු. 50,000 වැටුපකට හිමිකම් ඇත. තෙරේසා යෙදූ ප්‍රග්ධනය රු. 1,000,000 වන අතර ඒ මත 10% ක ප්‍රාග්ධන පොළියට ඇයට හිමිකම් ඇත. 2019/2020 තක්සේරුව වර්ෂය සඳහා පහත තොරතුරු ඔබට සපයා ඇත.

1. හවුල් ව්‍යාපාරයේ 2019/2020 ශුද්ධ ලාභය රු. 12,125,400 කි. එම ලාභය ගණනයේදී අනෙකුත් ඉඩදෙන වියදම් වලට අමතරව පහත වියදම් අඩුකර ඇත.

| | |
|---|---|
| හවුල්කරු වැටුප් | රු. 600,000 |
| ගිණුම් කාලය | රු. 720,000 |
| කුලිය | රු. 900,000 |

2. හවුල් ව්‍යාපාරය සතුව ප්‍රවාහන කටයුතු සඳහා වෑන් රථය 2018/2019 දී අත්පත් කරගෙන ඇති අතර එහි පිරිවැය රු. 4,000,000 කි.
3. හවුල් ව්‍යාපාරය පවත්වාගෙන යන්නේ තෙරේසාගේ ගොඩනැගිල්ලක වන අතර ඒ සඳහා මාසික කුලිය රු. 75,000 බැගින් ඇය ලබා ගෙන ඇත.

මෙම තොරතුරු ආශ්‍රයෙන් පහත ගැටළු සඳහා පිළිතුරු සපයන්න.

a) හවුල් ව්‍යාපාරයේ බෙදිය හැකි ලාභය (ලකුණු 03)

b) හවුල් ව්‍යාපාරය රඳවාගන්නා බදු මුදල (ලකුණු 02)

c) ඒ ඒ හවුල්කරුට හිමිවන ලාභ කොටස දැක්වෙන ලේඛනයක් (ලකුණු 03)

d) ඒ ඒ හවුල්කරුට හිමිවන බදු බැර මුදල (ලකුණු 02)

(මුළු ලකුණු 10)

JMC Taxation Model Paper-Mahinda Danawardana

## 06 වන ප්‍රශ්නය

ස්ට්‍රොන් නිෂ්පාදන සමාගම සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන සිදු කරන ආයතනයක් වන අතර ඊට අමතරව දේශීය නිෂ්පාදකයින්ගේ විසිතුරු නිෂ්පාදන මිලට ගෙන විකිණීමේ ව්‍යාපාරයකද නිරත වේ. 2019 සැප්තැම්බර් 30 අවසන් කාර්තුවේ එයට අදාල පහත තොරතුරු ඔබට දී ඇත.

| | |
|---|---|
| කාර්තුවේ පිරිවැටුම | |
| නිෂ්පාදන විකිණීම මත | 11,123,400 |
| මිලට ගත් නිෂ්පාදන විකිණීම | 6,720,000 |
| කාර්යාල උපකරණ උපලබ්ධියෙන් | 750,000 |
| ගෙවූ ජාතික යෙදවුම් බදු | |
| නිෂ්පාදන අමුද්‍රව්‍ය ආනයනය මත | රු. 43,000 |
| පරිපාලන වියදම් මත | රු. 15,200 |
| මාසික වාරික මත ගෙවූ ජාතිය ගොඩනැගීමේ බදු | |
| 2019 ජුලි | 46,525 |
| 2019 අගෝස්තු | 30,000 |
| 2019 සැප්තැම්බර් | 40,000 |

**ඔබ විසින්,**

a) කාර්තුව සඳහා ජාතිය ගොඩනැගීමේ බදු ගණනය කරන්න. (ලකුණු 04)

b) කාර්තුව සඳහා ආර්ථික සේවා ගාස්තුව ගණනය කරන්න. (ලකුණු 03)

c) 2019 සැප්තැම්බර් 30 න් අවසන් කාර්තුවේ,

i. ජාතිය ගොඩනැගීමේ බදු වාර්තාව ඉදිරිපත් කල යුතු දිනය කුමක්ද?

ii. කාර්තුවේ ආර්ථික සේවා ගාස්තුව ගෙවිය යුතු දිනය කුමක්ද? (ලකුණු 03)

(මුළු ලකුණු 10)

## 07 වන ප්‍රශ්නය

ප්‍රමුඛ නිෂ්පාදන ආයතනයක් වන ජුමාර්වස් පුද්ගලික සමාගම 2019 ජුනි 30 න් අවසන් කාර්තුව සඳහා එකතු කල අගය මත ගණනය සඳහා පහත තොරතුරු ඔබට සපයා ඇත.

| | | |
|---|---|---|
| 1. | කාර්තුවේ පිරිවැටුම බදු රහිත වටිනාකම | |
| | නිෂ්පාදන විකිණීම | 7,450,000 |
| | නිෂ්පාදන අපනයන | 13,400,000 |
| | එ.අ. බදු නිදහස් විකුණුම් | 1,620,000 |
| | භාවිතා කල පරිගණකය විකිණීම | 350,000 |
| 2. | ගෙවූ යෙදවුම් බදු | |
| | නිෂ්පාදන අමුද්‍රව්‍ය ආනයන බද්ද මත | 742,000 |
| 3. | ඉදිරියට ගෙනා යෙදවුම් බද්ද | 20,000 |
| 4. | මාසික වාරික ලෙස ගෙවූ එ.අ. බදු | 110,000 |

JMC Taxation Model Paper-Mahinda Danawardana

**ඔබ විසින්** පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයිය යුතුය.

a) 2019 ජුනි 30 න් අවසන් කාර්තුවේ එකතු කල අගය මත බදු ගණනය කර දක්වන්න. (ලකුණු 06)

b) කාර්තුවේ ඉතිරි බදු මුදල ගෙවිය යුතු දිනය සඳහන් කරන්න. (ලකුණු 02)

c) වලංගු එකතු කල අගය මත බදු ඉන්වොයිසියක ඇතුලත් විය යුතු කරුණු මොනවාදැයි සඳහන් කරන්න. (ලකුණු 02)

(මුළු ලකුණු 10)

B කොටසෙහි අවසානය

## C කොටස

(මුළු ලකුණු 50)

අනිවාර්යය ප්‍රශ්න 02 කි.

### 08 වන ප්‍රශ්නය

සාමාසහිත සී.එන්.සී (පෞද්ගලික) සමාගම (CNS) අධ්‍යාපන සේවා සපයන ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙලේ සමාගමකි. සමාගමේ නිකුත් කල ප්‍රාග්ධනය හා මුළු සංචිත පිලිවෙලින් රු. 25,000,000 සහ රු. 5,000,000 ක් විය.

2019/2020 තක්සේරු වර්ෂය සඳහා CNS සමාගමෙහි පහත සඳහන් තොරතුරු ඔබට සපයා ඇත.

1. 2019/2020 තක්සේරු වර්ෂය සඳහා සමාගමේ පිරිවැටුම රු. 467,780,000 ක් සහ ආදායම් බද්දට පෙර ශුද්ධ ලාභය රු. 33,271,500 ක් විය.
2. ඉහත ලාභය තුල ඇතුලත් වෙනත් ආදායම් පහත පරිදි වේ.

| | |
|---|---|
| ශුද්ධ ලාභාංශ | 688,00 |
| ස්ථාවර තැන්පතු දල පොලිය (මෙම පොලිය මත බැංකුව රඳවාගත් බදු අඩුකර ඇත) | 1,230,000 |
| ප්‍රවාහන කටයුතු සඳහා භාවිතා කල වෑන් රථය විකිණීමේ ලාභය | 620,000 |

3. 2020/3/31 දිනට පැවති වත්කම් පිලිබඳ තොරතුරු.

| වත්කම් | මිලට ගත් වර්ෂය | පිරිවැය |
|---|---|---|
| ඉඩම් | 2017/18 | 7,000,000 |
| ගොඩනැගිලි | 2019/20 | 12,000,000 |
| පරිගණක | 2018/19 | 800,000 |
| පරිගණක | 2019/20 | 700,000 |
| ලී බඩු | 2016/17 | 4,000,000 |
| නව වෑන් රථය | 2019/20 | 6,300,000 |

- වර්ෂය තුලදී ඉවත් කල වෑන් රථය 2016/2017 දී රු. 3,000,000 කට අත්පත් කර ගෙන තිබූ අතර එය 2019/2020 දි විකිණීමෙන් රු. 2,100,000 ක මුදලක් ලැබී තිබුණි.

4. සියලු වියදම් අඩු කිරීමෙන් ඉහත ලාභය ගණනය කර තිබූ අතර එහි ඇතුලත් වූ විශේෂිත වියදම් පහත පරිදි සඳහන් වේ.
   - වත්කම් සඳහා ගිණුම් කාලය රු. 3,120,500 කි.
   - වෘත්තීය සුදුසුකම් ලත් අධ්‍යක්ෂවරුන්ට ගෙවූ කළමනාකරණ ගාස්තුව රු. 7,000,000 කි.
   - ඉහත දැක්වූ 2018/19 පරිගණක සඳහා දරන අළුත්වැඩියා වියදම රු. 80,000 කි.
   - අධ්‍යාපනයේ නව අවස්ථා හා අවශ්‍යතා පිළිබඳ සිදුකල වෙළඳපොල සමීක්ෂණ වියදම රු. 700,000 කි.

JMC Taxation Model Paper-Mahinda Danawardana

- පාරිතෝෂික ප්‍රතිපාදන ලෙස රු. 200,000 ලාභ ගණනය සඳහා අඩු කර තිබූ අතර පාරිතෝෂික ලෙස, සත්‍ය ලෙස වසරේ ගෙවූ රු. 300,000 ක මුදල වෙන්කිරීමේ ගිණුමේ හරට දක්වා තිබුණි.
- සමාගම ලබාගත් දිගුකාලීන සහ කෙටිකාලීන ණය ප්‍රමාණය රු. 130,000,000 වූ අතර ඒ මත වර්ෂයේ ගෙවා තිබූ පොලී මුදල රු. 20,800,000 කි.
- ජාතික වකුගඩු අරමුදලට කර තිබූ පරිත්‍යාග රු. 815,000 විය.

5. 2018/2019 වර්ෂයේ ඉදිරියට ගෙන ආ බදු අලාභය රු. 7,300,000 කි.
6. සමාගම ස්වතක්සේරු ක්‍රමය යටතේ 2018/2019 ගෙවා තිබූ මුදල රු. 8,000,000 කි.
7. 2019/2020 තක්සේරු වර්ෂය සඳහා ගෙවූ ආර්ථික සේවා ගාස්තුව වන රු. 2,338,000 මුදලක් ද විය.

**ඔබ විසින් කල යුතු දෑ,**

2019/2020 තක්සේරු වර්ෂය සඳහා සමාගමේ පහත සඳහන් දෑ තක්සේරු කරන්න.

a) තක්සේරු කල හැකි ආදායම
b) බදු අය කල හැකි ආදායම
c) ගෙවිය යුතු දළ ආදායම් බද්ද
d) ගෙවිය යුතු ඉතිරි ආදායම් බද්ද

**සැලකිය යුතුයි:**
**කිසියම් ආදායමක් වියදමක් අඩු කිරීමට ඉඩ දිම හෝ ඉඩ නොදීම පිළිබඳ හේතු දැක්විය යුතුය.**

(ලකුණු 25)

## 09 වන ප්‍රශ්නය

ප්‍රධාන අපනයන සමාගමක් වන මර්ස් පුද්ගලික සමාගමේ මූල්‍ය පාලකවරයා ලෙස වරලත් ගණකාධිකාරවරයෙකු වන සංදීප මහතා සේවය කරයි. ඔහු වාසිකයකු වන අතර 2019/2020 තක්සේරු වර්ෂය (මින්මතු වර්ෂය යැයි හැඳින්වෙන) සඳහා පහත තොරතුරු ඔබට සපයා ඇත.

1. වර්ෂය සඳහා ඔහුගේ සේවායෝජක පහත ප්‍රතිලාභ ලබා දී ඇත. (මූලික සේවා නියුක්තිය මත)
   - දළ වැටුප මසකට රු. 250,000 බැගින්
   - 2018 දෙසැම්බර් මාසයේදි රු. 250,000 ප්‍රසාද දීමනාවක් ලබා දී ඇත.
   - කුලි රහිතව ඔහුට නිවසක් සපයා ඇත.
   - එන්ජිමේ ධාරිතාව CC 1700 වන කාර් රථයක් ඉන්ධන සමඟ සපයා ඇත.
   - වර්ෂය සඳහා ප්‍රතිපුරණය කල දුරකථන බිල්පත් වටිනාකම රු. 80,000
   - වර්ෂය තුලදි ඔහුගේ පුත්‍රයාගේ ක්‍රිඩා ජයග්‍රහණයක් වෙනුවෙන් රු. 50,000 ත්‍යාගයක් ලබා දෙන ලදී.
   - සේවක අර්ථසාධක (12%) සහ සේවකභාර අරමුදල (3%) නිසි පරිදි දායක කර ඇත.

2. තවත් සමාගමක් වන පර්ස් සමාගමේ අධ්‍යක්ෂවරයකු ලෙස සේවය කිරීම සඳහා රු. 63,000 ක රඳවාගත් බදු අඩුකල පසු රු. 587,000 ගාස්තුවක් ද ඔහුට ලැබී ඇත. (ද්විතීයික සේවා නියුක්තියෙන්)
3. විදේශ සේවා දායකයින්ට උපදේශන සේවා ලබා දී ලැබූ ආදායම ඇ.ඒ. ඩොලර් 3500 කි. ඩොලර් 1 = රු. 185/-
4. ස්ථාවර තැන්පතුවක් මත ලද ශුද්ධ පොලිය රු. 475,000 කි.
5. සමාගම්වල කොටස් ආයෝජනය මත ලැබූ ශුද්ධ ලාභාංශය රු. 860,000 කි.

JMC Taxation Model Paper-Mahinda Danawardana

6. ලැයිස්තුගත කොටස් විකිණීම මත ලැබූ මුදල රු. 1,040,000 කි. මෙම කොටස් මිලට ගෙන තිබුනේ රු. 780,000 මුදලකටය.
7. ඔහුට උරුම තවත් නිවසක් කුලියට දීමෙන් මාසික කුලිය රු. 75,000 ක් ගෙවා තිබුණි. මෙම නිවසේ වරිපනම් රු. 40,000 කුලීකරු දරා ඇත.
8. වර්ෂය තුල පහත වියදම් ඔහු දරා තිබුනි.
   - ගමේ විහාරස්ථානයේ කඨින පිංකම සඳහා රු. 100,000
   - වැඩිහිටියන් රැක බලාගන්නා අනුමත ප්‍රධාන ආයතනයකට ආහාරද්‍රව්‍ය රු. 120,000 ද, මුදලින් රු. 60,000
   - ජාතික පිලිකා නිවාරන අරමුදලට රු. 200,000
9. ස්වතක්සේරු පදනම මත රු. 138,000 ක ආදායම් බදු වසර තුල ගෙවා තිබුනි.
10. සේවායෝජක අඩු කර ප්‍රේෂණය කරන ලද උපයන විට ගෙවීමේ බදු මුදල (PAYE) රු. 146,000 කි.

**මෙම තොරතුරු ආශ්‍රයෙන් ඔබ විසින්,**

2019/2020 වර්ෂය සඳහා සංදීපගේ පහත සඳහන් දෑ තක්සේරු කරන්න.

a) බදු අයකල හැකි ආදායම

b) ගෙවිය යුතු දළ ආදායම් බද්ද

c) ගෙවිය යුතු ඉතිරි/ වැඩිපුර ගෙවූ බද්ද සහ

d) බදු නිදහස් ආදායම

(ලකුණු 25)

C කොටසෙහි අවසානය

JMC Taxation Model Paper-Mahinda Danawardana